**පූර්ව ආර්තව සහලක්ෂණය කෙරෙහි කාංසා ගතිලක්ෂණ බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්**

**(කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරෙන් )**

**යූ. වාසනා ලක්ෂාන්ති ප්‍රනාන්දු**

**කුඹුකන්දන රේවත හිමි**

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**සංක්ෂේපය**

ආර්තව සහලක්ෂණය කාංසා ගතිලක්ෂණ කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක් යන මාතෘකාව යටතේ පළමු උපාධි පාඨමාලාවේ අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදි. ඒ අනුව පූර්ව ආර්තව අවධියේ දී මුහුණ දෙන කාංසා ගතිලක්ෂණ හඳුනාගැනීම, පූර්ව ආර්තව අවධිය ආශ්‍රිත පූර්ව ආර්තව සහලක්ෂණ අක්‍රමතාව හඳුනාගැනීම හා එම අක්‍රමතාව හා කාංසා ගතිලක්ෂණ අතර සහසම්බන්ධතාව හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ අරමුණු විය. අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත ලබාගැනීම පර්යේෂකයා විසින් ම සකස් කරන ලද පූර්ව ආර්තව ආතති සහලක්ෂණ ප්‍රශ්නාවලිය සහ කාංසා ගතිලක්ෂණ පිළිබඳ ස්වයං ඇගයුම් ප්‍රශ්නාවලිය යන ප්‍රශ්නාවලී ද්විත්වය සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ තෝරාගත් පරීක්ෂාමානීන් 50 දෙනෙකුගෙන් යුත් නියැදියකට ලබා දෙන ලදි. එම පූර්ව ආර්තව සහලක්ෂණ ප්‍රශ්නාවලිය පූර්ව ආර්තව අවධිය තුළ ඇති පූර්ව ආර්තව සහලක්ෂණයට අයත් ලක්ෂණ හඳුනාගැනීම සඳහා ද කාංසා ගතිලක්ෂණ පිළිබඳ ස්වයං ඇගයුම් ප්‍රශ්නාවලිය කාංසා ගතිලක්ෂණ හඳුනාගැනීම සඳහා යොදාගන්නා ලදි. අනතුරුව ප්‍රශ්නාවලී භාවිතයෙන් ලබාගත් දත්ත විස්තරාත්මක හා අනුමිතික සංඛ්‍යාන ක්‍රම යොදාගනිමින් SPSS මෘදුකාංගය ඇසුරෙන් ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කෙරිණි. ඒ යටතේ කයි වර්ගයේ පරීක්ෂා සංඛ්‍යාන ක්‍රමය භාවිතා කොට පූර්ව ආර්තව සහලක්ෂණයට අයත් ලක්ෂණ සහ කාංසා ගතිලක්ෂණ අතර සම්බන්ධතාවයක් ඇති බව අනාවරණය කරගනු ලැබීය. එහිදී ශිෂ්‍යාවන් තුළ බහුලව පූර්ව ආර්තව සහලක්ෂණයට හා කාංසා ගතිලක්ෂණයට අයත් කායික, මානසික හා චර්යාත්මක ලක්ෂණ දක්නට ලැබුණි. ඒ අනුව මෙම අධ්‍යයනයේ දී පූර්ව ආර්තව සහලක්ෂණයට අයත් ලක්ෂණ හා කාංසා ගතිලක්ෂණ අතර ධනාත්මක සහසම්බන්ධතාවක් පැවති බව නිගමනය කළ හැකිය. එමෙන් ම මෙම තත්වය යටතේ ශිෂ්‍යයාවන්ගේ කායික, මානසික හා චර්යාත්මක යහපැවැත්ම වෙනුවෙන් ඔවුන් තුළ සංයම අභ්‍යාසකරණය පිළිබඳවත්, දෛනික ව්‍යායාම කිරීම පිළිබඳවත්, පෝෂ්‍යදායී ආහාර ගැනීම හා විටමින්*යකඩ වැනි අතිරේක පරිපූරක ඖෂධ ලබාගැනීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම හා ඒවා ප්‍රායෝගික මට්ටමින් සිදුකිරීම අවශ්‍ය බවත් ඒ සඳහා විශ්වවිද්‍යාල මට්ටමින් යම්කිසි සෞඛ්‍ය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම අවශ්‍යයැයි යෝජනා කළ හැක. එමෙන් ම මේ සම්බන්ධ අනාගත පර්යේෂණයක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යාවන්ගේ අධ්‍යයන කාර්යඵලය කෙරෙහි පූර්ව ආර්තව කාංසා ගතිලක්ෂණය බලපාන ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම සුදුසුයැයි ද යෝජනා කෙරේ.

මුඛ්‍ය පදඃ ආර්තවය, ආර්තව චක්‍රය, පූර්ව ආර්තව සහලක්ෂණය, කාංසාව, කාංසා ගතිලක්ෂණ

*1. දර්ශනය, දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*